# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1,225/32 - 2002 මාර්තු 01 වැනි සිකුරාදා - 2002.03.01

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය පිළිබඳ 1986 ඔක්තෝබර් මස 15 වැනි දින අංක 423/12 දරන රජයේ ගැසට් පත්‍රයේ පළකරන ලද ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය සහ ඉන්පසුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ එම ව්‍යවස්ථාවට ඉන්පසු වරින්වර කරනු ලැබූ සංශෝධනයන් වෙනුවට පහත සඳහන් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය ආදේශකර පළකරනු ලැබේ.

2. (අ) "ව්‍යවස්ථා සංග්‍රහය" යන පදයෙන් අදහස් කෙරෙන්නේ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයයි.
(ආ) "කමිටුව" යන පදයෙන් අදහස් කෙරෙන්නේ අධ්‍යාපන සේවා කමිටුවයි.
(ඇ) "සේවය" යන පදයෙන් අදහස් කෙරෙන්නේ අවස්ථාවෝචිත පරිදි ශ්‍රී ලංකා අධ්‍යාපන සේවය හෝ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයයි.
(ඇ) "නියමිත දිනය" යන පදයෙන් අදහස් කෙරෙන්නේ 1984 දෙසැම්බර් 31 වැනි දිනය.
(ඉ) "ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය දීප ව්‍යාප්ත සේවාවකි".

3. පහත සඳහන් වැටුප් පරිමාණ සහිතව හා පහත සඳහන් සංඛ්‍යාවලින් III පන්තියට පත්කරන ලද හා II පන්තියට හා I පන්තියට උසස් කිරීමෙන් පත්කරන ලද නිලධාරීන්ගෙන් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය සමන්විත වේ.

I පන්තිය
සේවක සංඛ්‍යාව : 200
වාර්ෂික වැටුප් පරිමාණය : රු.1,79,520 - 10 x 8,160 - 2,61,120

II පන්තිය
සේවක සංඛ්‍යාව : 300
වාර්ෂික වැටුප් පරිමාණය : රු.1,38,540 - 7 x5,520 - 1,77,180

III පන්තිය
සේවක සංඛ්‍යාව : 1783
වාර්ෂික වැටුප් පරිමාණය : රු. 97,500 - 15 x 2,700 - 1,38,000 (රු. 1,05,600 ට පෙර 1 වැනි කාර්යක්ෂමතා කඩඉම සහ රු. 1,19,100 ට පෙර 2 වැනි කාර්යක්ෂමතා කඩඉම)

සංලක්ෂය

(i) (අ) සීමිත තරග විභාගයේ II පන්තියේ හා III පන්තියේ සේවක සංඛ්‍යාව සාමාන්‍ය සේවක සංඛ්‍යාවකින් හා විශේෂ සේවක සංඛ්‍යාවකින් සමන්විත වේ.

(ආ) සීමිත තරග විභාගයේ ප්‍රතිඵල හෝ කුසලතා මත උසස් කිරීමෙන් හෝ පත් කරනු ලබන නිලධාරියෙකු 2 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් හා 2 වන භාෂා පරීක්ෂණයෙන් සමත් වී හෝ ඉන් නිදහස් කරනු ලැබ හෝ ඇත්නම්, සේවයේ අවුරුදු හයක සතුටුදායක සේවයක් සම්පූර්ණ කිරීමෙන් පසුව 1988.06.07 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි රු. 48,000 ක වැටුප් තලයේ තබනු ලැබේ

(ඇ) විවෘත තරග විභාගයේ ප්‍රතිඵල මත පත් කරනු ලබන නිලධාරියෙකු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ දෙකෙන් හා 2 වන භාෂා පරීක්ෂණයෙන් සමත් වී හෝ ඉන් නිදහස් නිදහස් කරනු ලැබ හෝ ඇත්නම් සේවයේ අවුරුදු හයක සතුටුදායක සේවයක් සම්පූර්ණ කිරීමෙන් පසුව 1988.06.07 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි රු. 48,000 ක වැටුප් තලයේ තබනු ලැබේ.

(ඈ) ඉහත විධිවිධාන අනුව නිලධාරියෙකුට දෙනු ලබන වැටුප් වර්ධක වාසි සේවයේ නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතාවය කෙරෙහි බල නොපානු ඇත.

(ii) සේවක සංඛ්‍යාව, අධ්‍යාපන අමාත්‍යාංශයේ අවශ්‍යතාවන්ට අනුව කලින් කලට වෙනස් කරනු ලැබිය හැකිය.

4. යම් වර්ෂයක යම් පන්තියක පිරවීමට ඇති පුරප්පාඩු සංඛ්‍යාව එම වර්ෂයේ ජනවාරි 1 දින සහ ජූනි 1 දින තිබූ පුරප්පාඩු සංඛ්‍යාව විය යුතුය.

5. (අ) (iii) පන්තියට පත් කිරීම

(i) විවෘත තරග විභාගයක ප්‍රතිඵල මත

(ii) සීමිත තරග විභාගයක ප්‍රතිඵල මත සහ

(iii) ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතා මත උසස් කිරීමෙන් සිදුකරනු ලැබේ.

(ආ) කමිටුව විසින් නියම කරන ලද පරිදි, එම කමිටුව වෙනුවෙන් විභාග කොමසාරිස් විසින් පවත්වනු ලබන විවෘත තරග විභාගයක හා සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත සේවයේ III පන්තියේ පුරප්පාඩු වලින් සියයට (25%) නොවැඩි පුරප්පාඩු සංඛ්‍යාවකට පත්කිරීම කමිටුව විසින් කරනු ඇත. මෙම විභාගයේ විස්තර "අ" පරිශිෂ්ඨයෙහි දක්වා ඇත.

(ඇ) එක් අවස්ථාවකදී පත්කළ යුතු සංඛ්‍යාව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ අදහස් විමසීමෙන් පසුව කමිටුව විසින් තීරණය කරනු ලැබේ.

විවෘත තරග විභාගය – සාමාන්‍ය සේවක සංඛ්‍යාව

6. පහත සඳහන් සුදුසුකම් තිබෙන පුද්ගලයෙක් විවෘත තරග විභාගයකට පෙනී සිටීමට සුදුසුකම් ලබයි.

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම.

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම හෝ යටත් පිරිසෙයින් ඒ හා සම මට්ටමෙහිලා කමිටුව සළකන යම් වෘත්තීය හෝ වෙනත් විභාගයකින් සමත්වීම.

(ඇ) ඉල්ලුම්පත් භාර ගැනීමේ අවසාන දිනය ඇතුළත් මාසයට පූර්වාසන්න මාසයේ අවසාන දිනට වයස අවුරුදු 22 කට එළඹ තිබීම හා වයස අවුරුදු 26 ට එළඹ නොමැතිවීම.

(ඈ) විශිෂ්ඨ චරිතයකින්, මනා ශරීර ශක්තියකින් හා හොඳ ඇස් පෙනීමකින් යුක්ත වීම (පත් කිරීම සඳහා තෝරාගනු ලැබුවහොත් වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.)

7. විභාගයට පෙනී සිටීම සඳහා අයදුම්පතක් ඉදිරිපත් කිරීමේ ක්‍රමය හා අවශ්‍ය ගාස්තු ප්‍රමාණය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබේ.

සීමිත තරග විභාගය – සාමාන්‍ය සේවක සංඛ්‍යාව

8. කමිටුව විසින් නියම කරන ලද පරිදි එම කමිටුව වෙනුවෙන් විභාග කොමසාරිස් විසින් පවත්වනු ලබන සීමිත තරග විභාගය හා සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත සේවයේ III වැනි පන්තියේ පුරප්පාඩු වලින් සියයට හතළිස් පහකට (45%) නොවැඩි පුරප්පාඩු සංඛ්‍යාවකට පත්කිරීම කමිටුව විසින් කරනු ඇත. මෙම විභාගයේ විස්තර "ආ" පරිශිෂ්ඨයේ දක්වා ඇත.

9. (අ) පහත සඳහන් සුදුසුකම් තිබෙන රජයේ ගුරුවරයෙක්, ආධාර ලබන පාසල්වල ගුරුවරුන් හා පිරිවෙන් වල ගුරුවරුන් සේවයේ සාමාන්‍ය සේවක සංඛ්‍යාවට පත්කරනු ලැබීම සඳහා වන සීමිත තරග විභාගයට පෙනීසිටීම සඳහා සුදුසුකම් ලබයි.

(i) ඉල්ලුම්පත් භාර ගැනීමේ අවසාන දිනය ඇතුළත් මාසයට පූර්වාසන්න මාසයේ අවසාන දිනට වයස අවුරුදු 25 ට නොඅඩුවීම සහ අවුරුදු 45 ට නොවැඩිවීම, කෙසේ වුවද 1985.01.01 දින හෝ ඊට පසුව රජයේ සේවයට පත්කර ඇති අයෙකු සම්බන්ධයෙන් වන කල්හි උපරිම වයස් සීමාව අවුරුදු 40 වීම සහ

(ii) උපාධියෙන් පසුව යටත් පරිසෙයින් වර්ෂ 5 ක ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති උපාධිධාරී ගුරුවරයෙකු (හෝ කමිටුව විසින් සම තත්ත්වයේ ලා සළකනු ලබන වෘත්තීය හෝ වෙනත් විභාගයකින් සමත් වූ අයෙකු) වීම, පුහුණු ගුරු සහතිකය සහිත උපාධිධාරියෙකු (හෝ කමිටුව විසින් උපාධියක සම තත්ත්වයෙහි ලා සළකනු ලබන වෘත්තීය හෝ වෙනත් විභාගයකින් සමත් වූ අයෙකු) වීම හෝ පුහුණුවෙන් පසු යටත් පිරිසෙයින් අවුරුදු 5 ක ඉගැන්වීමේ පළපුරුද්ද ලබා ඇති පුහුණු ගුරුවරයෙක් වීම හෝ ගුරුවරයෙකු වශයෙන් පූර්ණ අවුරුදු 10 ක සේවයක් ඇති පුහුණු ගුරුවරයෙකු වීම.

(ආ) පහත සඳහන් සුදුසුකම් තිබෙන රජයේ ගුරුවරයෙක්, ආධාර ලබන පාසල්වල ගුරුවරුන් හා පිරිවෙන්වල ගුරුවරුන් සේවයේ විශේෂ සේවක සංඛ්‍යාවට පත්කරනු ලැබීම සඳහා වන සීමිත තරග විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබයි.

(i) ඉල්ලුම්පත් භාර ගැනීමේ අවසාන දිනය ඇතුළත් මාසයට පූර්වාසන්න මාසයේ අවසාන දිනට වයස අවුරුදු 25 ට නොඅඩුවීම සහ අවුරුදු 45 ට නොවැඩිවීම, කෙසේ වුවද 1985.01.01 දින හෝ ඊට පසුව රජයේ සේවයට පත්කර ඇති අයෙකු සම්බන්ධයෙන් වන කල්හි උපරිම වයස් සීමාව අවුරුදු 40 වන්නේය. සහ

(ii) යටත් පිරිසෙයින් අවුරුදු 3 ක් ඉගැන්වීමේ හෝ නියමිත විෂය පිළිබඳ ප්‍රායෝගික පළපුරුද්ද සහිත පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරියකු (හෝ කමිටුව විසින් සම තත්ත්වයෙහිලා සළකනු ලබන වෘත්තීය හෝ වෙනත් විභාගයකින් සමත් අයෙකු) වීම.

සංලක්ෂය -

(1) නැටුම්, පෙරදිග සංගීතය, බටහිර සංගීතය, හස්ත කර්මාන්තය සහ ශාරීරික අධ්‍යාපනය, චිත්‍රකලා, ගෘහ විද්‍යාව, විශේෂ අධ්‍යාපනය හා ඉංග්‍රීසි යන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් අදාළ විෂයය පිළිබඳව ගුරුවරයෙකු වශයෙන් අවුරුදු 5 කට නොඅඩු සේවයක් ඇති හා දෙකකට නොවැඩි වාර ගණනක දී ගණිතය හෝ අංකගණිතය සහ සිංහල / දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් හයකින් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වූ අපේක්ෂකයෙකු ද මෙම විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලැබූවෙකුසේ සළකනු ලැබේ.

(2) මෙම අනුග්‍රහය පිරිවෙන් වල සහ ආධාර ලබන පාසල් වල ගුරුවරුන්ට රාජ්‍ය සේවකයින් වශයෙන් සළකනු ලැබීමට අයිතිවාසිකමක් නොවේ.

10. විභාගයට අයදුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රමය සහ නියමිත ගාස්තු ප්‍රමාණය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබේ.

11. (අ) කිසිම පුද්ගලයෙකුට 3 වරකට වඩා විවෘත තරග විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) කිසිම පුද්ගලයෙකුට 7 වරකට වඩා සීමිත තරග විභාගයකට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ඇ) කිසිම පුද්ගලයෙකුට සීමිත තරග විභාගය සහ විවෘත තරග විභාගය යන මේ විභාග දෙකටම 7 වරකට වඩා පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

කුසලතා මත උසස් කිරීම

12. සේවයේ III පන්තියේ පුරප්පාඩු වලින් සියයට තිහකට (30%) නොවැඩි පුරප්පාඩු සංඛ්‍යාවකට කුසලතා මත උසස් කිරීමෙන් කමිටුව විසින් පත් කිරීම කරනු ලැබේ.

13. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I වන ශ්‍රේණියේ අවුරුදු 3 ක අවම සේවයක් ඇති විදුහල්පති සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරියෙකු කුසලතා මත උසස් කිරීම සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි. ශ්‍රී ලංකා විදුහල්පති සේවයට අන්තර්ග්‍රහණය කිරීමට කලින් සමාන තනතුරක දැරූ සේවා කාලය ද විදුහල්පති සේවයේ I වෙනි ශ්‍රේණියේ තනතුරක සේවා කාලයක් සේ ගණන් ගනු ලැබේ.

14. කමිටුවේ ලේකම් විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛයකින් සහ/හෝ කමිටුව විසින් සුදුසු යයි සලකනු ලබන වෙනත් යම් නිවේදනයක් මගින් අයදුම්පත් කැඳවනු ලබන අවස්ථාවකදී කුසලතා මත උසස් කිරීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

15. (අ) විවෘත තරග විභාගයේ ප්‍රතිඵල මත සේවයට පත් කරනු ලබන පුද්ගලයෙකු අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ට පිළිගත හැකි ආයතනයකින් ඉගැන්වීමේ පළපුරුද්දක් ඒ වන විටත් ලබා නැත්නම්, යටත් පිරිසෙයින් වර්ෂයක ඉගැන්වීමේ පළපුරුද්දක් ලබා ගන්නා ලෙස ඔහුට නියම කරනු ලැබේ. මේ කාර්යය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් එම තැනැත්තා පාසලකට හෝ වෙනත් ඉගැන්වීමේ ආයතනයකට අනුයුක්ත කරනු ලැබිය හැකිය.

(ආ) අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් තීරණය කරන වෙනත් යම් පුහුණුවක් ලබා ගන්නා ලෙස සේවයට පත් කරන ලද නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

(ඇ) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ කවර පන්තියක හෝ සාමාන්‍ය සේවක සංඛ්‍යාවට පත්කරනු ලබන හෝ උසස් කරනු ලබන තැනැත්තෙකු එසේ පත්කරනු ලැබීමට හෝ උසස් කරනු ලැබීමට පෙරාතුව, කිසියම් අවස්ථාවක අවම වශයෙන් අවු. 03 ක කාලයක් රජයේ පාසලක විදුහල්පතිවරයෙකු වශයෙන් සේවය කර නොමැත්තේ නම් එසේ උසස් කරනු හෝ පත්කරනු ලැබූ විට වර්ෂ 03 ක කාලයක් රජයේ පාසලක විදුහල්පතිවරයෙකු වශයෙන් අනිවාර්යයෙන්ම සේවය කළ යුතුය. කිසියම් තැනැත්තෙකු එසේ සේවය කර තිබූ කාලසීමාව වර්ෂ 03 කට වඩා අඩුවන අවස්ථාවක දී එසේ පත්කරනු ලැබීමෙන් හෝ උසස් කරනු ලැබීමෙන් පසු සම්පූර්ණ කළයුතු සේවා කාලය කලින් ඔහු විසින් සේවය කළ කාලය හා වර්ෂ 03 ක කාලසීමාව අතර, වෙනසට සමාන විය යුතුය.

**II පන්තියට උසස් කිරීම - සාමාන්‍ය සේවක සංඛ්‍යාව**

16. වෙනත් විධිවිධාන පනවනතුරු III පන්තිය යටතේ උපලේඛන ගතකර ඇති හෝ සමාන්තර තනතුරක් වශයෙන් කමිටුව විසින් නිශ්චය කරන තනතුරක දස අවුරුදු සතුටුදායක සේවා කාලයක් සහිත පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය මත කමිටුව විසින් II වන පන්තියට උසස් කරනු ලැබේ.

i. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III පන්තිය තනතුරෙහි ස්ථිර කර තිබීම.
ii. I හා II කාර්යක්ෂමතා කඩඉම් විභාගවලින් සහ දෙවන භාෂාවෙන් සාමාර්ථය ලබා තිබීම හෝ නිදහස් කර තිබීම.
iii. උසස්වීම සඳහා සුදුසුකම් ලැබීමට නියමිත දිනට පූර්වාසන්න පස් අවුරුදු කාලය තුළ නියමිත දිනවලදී සියළු වැටුප් වර්ධකයන් උපයා ගෙන තිබීම.

සංලක්ෂ්‍යය - උසස්වීම් සඳහා සුදුසුකම් ලැබීමට පූර්වාසන්න පස් අවුරුදු කාලය තුළ සිදුකරන ලද යම් වරදකට විනයානුකූල දඬුවම් ලබා නොතිබේ නම් නිලධාරියෙකුගේ සේවය සතුටුදායක යයි සළකනු ලැබේ.

17. මෙම ඡේදය, ඉහත 16 වන ඡේදයේ සඳහන් "වෙනත් විධිවිධාන" පනවනතුරු ඉවත් කරන ලදී.

18. [illegible] පන්තියේ පුරප්පාඩු පුරවනු ලබන්නේ පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් දරන හෝ එයට සමාන යයි කමිටුව විසින් සළකනු ලබන වෘත්තීය හෝ වෙනත් විභාගයකින් සමත් II පන්තියේ නිලධාරීන් උසස් කිරීමෙනි. එසේ උසස් කළ යුතු නිලධාරීන්ගේ නම් යෝජනා කරනු ලබන්නේ අධ්‍යාපන විෂයය භාර කැබිනට් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකුගේ සභාපතිත්වයෙන් යුතු කැබිනට් අමාත්‍යාංශයන්හි අතිරේක ලේකම්වරුන් තිදෙනෙකුගෙන් සමන්විතව කමිටුව විසින් පත් කෙරෙන මූලික පරීක්ෂණ මණ්ඩලයක හා අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් හා තවත් කැබිනට් අමාත්‍ය ලේකම්වරුන් දෙදෙනෙකුගෙන් සමන්විතව කමිටුව විසින් පත් කෙරෙන අවසාන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක නිර්දේශය පරිදිය. අවසාන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මගින් සම්මුඛ පරීක්ෂණයට කැඳවිය යුත්තේ මූලික පරීක්ෂණ මණ්ඩලය විසින් නිර්දේශ කරන ලද අපේක්ෂකයින් පමණි. පළමුවන පන්තියේ පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව තුන් ගුණයකට වැඩි නොවන සංඛ්‍යාවක් සේවයේ II පන්තියේ නිලධාරීන් අතුරෙන් ජ්‍යෙෂ්ඨතාවය පදනම් කොටගෙන මූලික සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබිය යුතුය.

19. විවෘත තරග විභාගයේ ප්‍රතිඵල මත සේවයේ III වන පන්තියට පත් කරනු ලබන පුද්ගලයෙකු අවුරුදු 3 ක පරිවාස කාලයකට යටත්වනු ඇත. එම කාලය අවසානයේදී පහත සඳහන් විභාග වලින් සාමාර්ථය ලැබුවහොත් පමණක් ඔහු ස්ථිර කරනු ලැබේ.

(අ) I වන කාර්යක්ෂමතා කඩඉම සහ
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පවත්නා නීතිරීති අනුව නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණ වලින් සමත් විය යුතුය.

සංලක්ෂ්‍යය - (අ) අවුරුදු 3 අවසානයේදී රාජ්‍ය භාෂා පරීක්ෂණය සමත් නොවන නිලධාරියෙකුගේ පත්වීම අවසන් කිරීමට ඉඩ ඇත.

(ආ) නියමිත දින සේවයේ නොසිටියාවූ නිලධාරියෙකු සේවයට අන්තර්ග්‍රහණය කර ඇති විට තම කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත්වීම සඳහා අන්තර්ග්‍රහණය කිරීමේ ලිපිය නිකුත් කළ දින සිට අවුරුදු 4 ක කාලයක් එම නිලධාරියාට දෙනු ලැබේ. නියමිත කාල සීමාව තුළ කාර්යක්ෂමතා කඩඉම් සමත්වීමට යටත්ව උසස් කිරීම් සඳහා සලකා බැලීමට ඔහු සුදුස්සකු වනු ඇත. මෙසේ කොන්දේසි සහිත උසස්වීමක් දෙනු ලබන නිලධාරියෙකු නියමිත කාලය තුළදී කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත්වීමට අපොහොසත් වුවහොත් ඔහුගේ වැටුප් වර්ධක විලම්භනය කරනු ලැබේ.

දෙවන භාෂා ප්‍රවීණතාවය :-

20. (අ) සේවයට පත්කර ඇති නිලධාරියෙකු 2 වන කාර්යක්ෂමතා කඩඉමෙන් උසස් කිරීමට පෙර දෙවන භාෂා විභාගයෙන් සමත් වී හෝ එයින් නිදහස් වී හෝ තිබිය යුතුය.

(ආ) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ කාර්යය සඳහා ආදී ප්‍රවේශකයෙකු ලෙස සැළකෙන නිළධාරියෙකු සම්බන්ධයෙන් වන කල්හි සිංහල නිළධාරියෙකු සඳහා දෙවන භාෂාව දෙමළ වන අතර, ද්‍රවිඩ නිලධාරියෙකු සඳහා එය සිංහල වන්නේය.

(ඇ) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ කාර්යය සඳහා නව ප්‍රවේශකයෙකු ලෙස සැළකෙන නිළධාරියෙකු සම්බන්ධයෙන් වන කල්හි සේවයට පත්කිරීමට තමා සුදුසුකම් ලැබුවේ සිංහල මාධ්‍යයෙන් නම් දෙවන භාෂාව දෙමළ හෝ ඉංග්‍රීසි වන අතර, සේවයට පත්කිරීමට තමා සුදුසුකම් ලැබුවේ දෙමළ හෝ ඉංග්‍රිසි මාධ්‍යයෙන් නම් දෙවනු භාෂාව සිංහල වේ.

(ඈ) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ කාර්යය සඳහා ආදි ප්‍රවේශකයෙකු ලෙස සැළකෙන සිංහල හෝ දෙමළ නිළධාරියෙකු අ.පො.ස. (සා.පෙළ) විභාගයට සමාන මට්ටමක පිළිවෙලින් සිංහල හෝ දෙමළ විභාගයකින් සාමාර්ථය ලැබුවහොත් එම නිළධාරියා දෙවන භාෂා විභාගයෙන් (එනම් පිළිවෙලින් සිංහල හෝ දෙමළ විභාගයෙන්) නිදහස් කරනු ලැබේ.

(ඉ) සේවයට ඇතුළුවීම පිණිස දෙමළ හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් සුදුසුකම් ලැබූ රාජ්‍ය භාෂාව පිළිබඳ කාර්යය සඳහා නව ප්‍රවේශකයෙකු ලෙස සැළකෙන නිලධාරියෙකු අංක 701 හා 1966 සැප්තැම්බර් මස 04 දින දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ නියමිත III ශ්‍රේණියේ සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙන් සාමාර්ථය ලබා තිබේ නම්, නැතහොත් එම පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබ තිබේ නම්, 2 වන භාෂාව පිළිබඳ විභාගයකින් සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

කාර්යක්ෂමතා කඩඉම් සුදුසුකම්

21. (අ) සේවයේ III වන පන්තියට පත්කර ඇති නිළධාරියෙකු වසරකට රු. 1,05,600 වැටුප් පියවරට එළඹීමට පෙර පළමු වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්විය යුතුය. පත්වීම ලැබීමේදී මෙම වැටුප් ලක්ෂ්‍යය පසුකර ඇති නිළධාරියෙකු තම පත්වීමේ දින සිට වසර තුනක කාලයක් ඇතුළත පළමු වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්විය යුතුය. මෙම විභාගය සඳහා වන විෂය නිර්දේශය "ඇ" පරිශිෂ්ඨයෙහි දක්වා ඇත.

(ආ) සේවයේ III වන පන්තියේ නිළධාරියෙකු වසරකට රු. 1,19,100 ක වැටුප් පියවරට එළඹීමට පෙර පළමු වන සහ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වී තිබිය යුතුය. දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය පිළිබඳ විස්තර "ඇ" පරිශිෂ්ඨයෙහි දක්වා ඇත.

(ඇ) වයස අවුරුදු 45 සම්පූර්ණවීමෙන් පසුව සේවයේ නිළධාරියෙකු දෙවන භාෂා පරීක්ෂණයෙන් සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ. වයස අවු. 45 සම්පූර්ණවීමෙන් පසුව සේවයේ නිළධාරියෙකු පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු නොලැබේ. (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 20/2001 අනුව වයස් සීමාව මත නිළධාරීන් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ වලින් නිදහස් නොකෙරේ.)

ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය

22. පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ලබාගත් උපාධියක් නොමැතිව සේවයේ II වන පන්තියට පත්කර ඇති නිළධාරියෙකු I වන පන්තියට උසස් කිරීමට ප්‍රථම අ.පො.ස. (සා.පෙළ.) විභාගයෙන් හෝ ඒ හා සමාන මට්ටමකින් ඉංග්‍රීසි භාෂාව සමත්විය යුතුය.

සේවයේ ජ්‍යෙෂ්ඨත්වය

23. (අ) III වන පන්තියේ ජ්‍යෙෂ්ඨතාවය, විවෘත තරග විභාගයේ ප්‍රතිඵල මත පත් කෙරෙන නිළධාරීන් සම්බන්ධයෙන් නම් ඔවුන් ස්ථිර කෙරෙන අවස්ථාවේ දී ද සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵල මත පත් කෙරෙන නිළධාරීන් සම්බන්ධයෙන් නම් ඔවුන්ගේ පත්වීම් කෙරෙන අවස්ථාවේ දී ද සාමාන්‍යයෙන් එම විභාගයේ ඔවුන්ගේ කුසලතා අනුපිළිවෙල අනුව නිශ්චය කරනු ඇත.

(ආ) III වන පන්තියට අන්තර්ග්‍රහණය කරනු ලබන නියමිත දින සේවයේ IV වන පන්තියේ සිටිය නිළධාරීහු ද, සැළසුම් නිළධාරීහු ද ගුරු විද්‍යාල කථිකාචාර්යවරුන් ද, (I වන ශ්‍රේණිය) I වන ශ්‍රේණියේ විශේෂ තනතුරුධාරීහු ද III වන පන්තියට අන්තර්ග්‍රහනය කරනු ලබන සෙසු නිළධාරීන්ට වඩා ජ්‍යෙෂ්ඨ වෙති. ඔවුන් අතර ජ්‍යෙෂ්ඨතාවය නිශ්චය කරනු ලබන්නේ එම පන්තිවලට / තනතුරුවලට පත්වීම කරන ලද දින අනුවය.

24. (අ) III වන පන්තියට අන්තර්ග්‍රහණය කර ඇති නියමිත දින සේවයේ IV පන්තියේ සිටි නිලධාරීන්, ගුරු විද්‍යාල කථිකාචාර්යවරුන් (I ශ්‍රේණිය) සැළසුම් නිලධාරීන්, I ශ්‍රේණියේ විශේෂ තනතුරුධාරීන් සහ III පන්තියේ සඳහන් තනතුරක වසර 10 කට නොඅඩු සතුටුදායක සේවයක් ඇති, III පන්තියට අන්තර්ග්‍රහණය කරනු ලැබ ඇති අනෙක් නිලධාරීන් ස්වකීය තනතුරුවල ස්ථිර කර ඇත්නම්, හා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ දෙකෙන් සහ දෙවන භාෂා පරීක්ෂණයෙන් සාමාර්ථය ලබා හෝ නිදහස් කර ඇත්නම් සේවයේ II පන්තියට උසස් කිරීමට සළකා බලනු ලැබේ.

(ආ) මෙම ඡේදය යටතේ II වන පන්තියට උසස් කරන ලද නිලධාරියෙකුගේ වැටුප තීරණය කරනු ලබන්නේ ව්‍යවස්ථා සංග්‍රහයේ 29 වැනි ඡේදය යටතේය.

(ඇ) (i) උසස්වීම් සඳහා සුදුසුකම් ලැබීමට පූර්වාසන්න පස් අවුරුදු කාලය තුල නියමිත දිනවල දී තමාගේ සියළුම වැටුප් වර්ධකයන් උපයාගෙන තිබේ නම්, සහ

(ii) උසස්වීම සඳහා සුදුසකම් ලැබීමට පූර්වාසන්න පස් අවුරුදු කාලය තුළ සිදුකරන ලද යම් වරදකට විනයානුකූල දඬුවම් ලබා නොතිබේ නම්,

නිලධාරියෙකුගේ සේවය සතුටුදායක යයි සළකනු ලැබේ.

25. යම් පුද්ගලයෙකු පහත සඳහන් කරුණු සපුරා ඇතොත් පමණක් සේවයට පත්කිරීම සඳහා වූ විභාගයකට අවශ්‍ය සුදුසුකමක් ලබා ඇත්තෙකු ලෙස සළකනු ලැබේ.

(අ) ඉල්ලුම්පත්‍ර භාර ගැනීමේ අවසාන දිනය ඇතුළත් මාසයට පූර්වාසන්න මාසයේ අවසාන දින වන විට සුදුසුකම් ලැබීමට නියමිත විභාගය හෝ විභාග සෑම අතින්ම සාර්ථක අන්දමින් සම්පූර්ණ කර තිබීම සහ

(ආ) සුදුසුකම් සම්බන්ධයෙන් නිල සහතිකය හෝ එම සහතිකය වෙනුවට කමිටුවට පිළිගත හැකි නිල ලියවිල්ලක් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කොට තිබීම.

26. 28 ඡේදය යටතේ සේවයට අන්තර්ග්‍රහණය කරන ලද නිලධාරියෙකුට විශ්‍රාම වැටුප් සංග්‍රහයේ 7 වන වගන්තිය යටතේ සේවයෙන් විශ්‍රාම ගැනීමේ අනුග්‍රහය ලබාදිය යුතු තරමට මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන වලින් අහිතකර බලපෑමක් සිදුවී ඇති බවට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් සෑහීමකට පත්වන්නේ නම් සේවයට අන්තර්ග්‍රහණය කිරීමේ ලිපිය ඔහු වෙත නිකුත් කළ දින සිට අවුරුදු 5 ක් ඇතුළත එම මනාපය ප්‍රයෝජනයට ගැනීමට යටත්ව ඔහු ඉල්ලීමක් කළහොත් එසේ සේවයෙන් විශ්‍රාම ගැනීමට ඉඩ දෙනු ලැබේ.

27. (අ)* ව්‍යවස්ථා සංග්‍රහයේ උපලේඛනයේ I වන පන්තියේ II වන පන්තිය සහ III වන පන්තිය යටතේ දක්වා ඇති තනතුරු සාමාන්‍යයෙන් සේවයේ නිලධාරීන් විසින් දරනු ලැබේ. කෙසේ වුවද, උපලේඛනයේ දක්වා ඇති ඕනෑම තනතුරකට ඕනෑම රජයේ නිලධාරියෙකු පත්කිරීමේ අයිතිය අමාත්‍ය මණ්ඩලය සතුව පවතී.

(ආ) කමිටුව විසින් අදාළ පළාත් රාජ්‍ය සේවා කොමිෂම හා ඇයි කරනු ලබන ගිවිසුමක් අනුව දැනටමත් පත්කර ඇති හා මින් ඉදිරියට නිලධාරීන් සේවයේ අවශ්‍යතා නිලධාරි අවශ්‍යතා සහ අභිකූත් අදාළ කරුණු මත එකඟවනු ලබන කාලසීමාවක් හෝ ද්විපාර්ශ්වික එකඟත්වයෙන් දීර්ඝ කරනු ලබන කාල සීමාවක් පළාත් රාජ්‍ය සේවයේ සේවය කළ යුතුවේ. එකී කාලසීමාව අවසන් වූ වහාම නැවතත් අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සේවක සංඛ්‍යාවට පැමිණීමට හෝ වෙනත් පළාත් රාජ්‍ය සේවාවක සේවය සඳහා මුදාහරිනු හෝ ලැබිය හැකිය.

(ඇ) සේවයේ නිලධාරියෙකු පළාත් රාජ්‍ය සේවයට මුදාහරිනු ලබන කාලය තුළ දී පත්කිරීම, මාරුකිරීම, සේවයෙන් පහ කිරීම හා විනය පාලනය කමිටුව විසින් තීරණය කරනු ලැබේ.

28. නියමිත දින සේවයේ සිටින නිලධාරීන්, ගුරු විද්‍යාල කථිකාචාර්යවරුන්, සැළසුම් නිලධාරීන් සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ I වන ශ්‍රේණියේ විශේෂ තනතුරුධාරීන් පහත දැක්වෙන ආකාරයට සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(අ) නියමිත දින සේවයේ I වන පන්තියේ හා II වන පන්තියේ සිටි නිලධාරීන් I වන පන්තියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(ආ) (i) නියමිත දින සේවයේ III වන පන්තියේ නිලධාරීන්, ගුරු විද්‍යාලවල කථිකාචාර්යවරුන් (අධිශ්‍රේණිය) සහ නියමිත දිනට සේවයේ IV වන පන්තියේ අවුරුදු 6 ක සේවයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් සියළු දෙනාම II වන පන්තියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(ii) 1984.12.31 වන දින වන විට අධ්‍යාපන සේවයේ IV වන පන්තියේ තනතුරු දරමින් සිටි නිලධාරීන්, සහ I වන ශ්‍රේණියේ විශේෂ තනතුරුධාරීන් 1985.01.01 දින සිට ද, 1985.12.01 දින සිට එම පන්තියට පත්වීම් ලැබූ නිලධාරීන් එදින සිට ද ශ්‍රී.ලං.අ. ප. සේ. II පන්තියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(ඇ) I ශ්‍රේණියේ විශේෂ තනතුරු දැරූ සියළුම නිළධාරීන්, ගුරු විද්‍යාලවල සිටි සියළුම කථිකාචාර්යවරුන් (I වන ශ්‍රේණිය), අධ්‍යාපන අමාත්‍යාංශයේ සියළුම සැළසුම් නිළධාරීන් III වන පන්තියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

සංලක්ෂය .– නියමිත දින විශේෂ සේවක සංඛ්‍යාවේ සිටි නිළධාරීන් ගුරු විදුහල් කථිකාචාර්යවරුන් හා සැළසුම් නිළධාරීන් විශේෂ සේවක සංඛ්‍යාවට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

29. නව පන්තිවලට අන්තර්ග්‍රහණය කිරීමේ දී නිළධාරීන්ගේ වැටුප් ආයතන සංග්‍රහයේ 7 වන පරිච්ඡේදයේ ප්‍රකාර සහ පහත දැක්වෙන විධිවිධානවලට යටත්ව තීරණය කරනු ලැබේ.

(i) නියමිත දින සේවයේ I වන පන්තියේ සිටි නිළධාරියකු රු. 36,600 - 2 x 900-1x 1,200-39,600/42,000- 1x 1,200 : 43,200 වැටුප් පරිමාණයේ පිහිටුවනු ලැබේ.

(ii) නියමිත දින සේවයේ II වන පන්තියේ සිටිය නිළධාරියෙකුට රු 31,200 - 5x900 -35,700 වැටුප් පරිමාණය පෞද්ගලික වනු ඇත. සේවයේ I වන පන්තියේ අවුරුදු 3ක් සම්පූර්ණ කිරීමෙන් පසු හෝ සේවයේ උපලේඛණගත කොට ඇති තනතුරකට අවුරුදු 20ක සේවයක් සම්පූර්ණ කිරීමෙන් පසුව හෝ රු. 31,200 - 5 x 900-35,700 යන වැටුප් පරිමාණයේ රු. 33,900 වැටුප් ලක්ෂ්‍යයට ළඟාවීමෙන් පසුව හෝ ඔහු රු. 36,600 - 2 x 900 -1 x 1,200 -39,600/42,000 - 1 x 1,200 - 43,200 ක වැටුප් පරිමාණයේ පිහිටවනු ලැබේ.

(iii) සේවයේ II වන පන්තියට අන්තර්ග්‍රහණය කරනු ලැබූ නිළධාරියෙකුට රු 23,400 - 10x 600 - 3 x900 - 32,100 වැටුප් පරිමාණය පෞද්ගලික වනු ඇත. සේවයේ II වන පන්තියේ අවුරුදු 5 ක් හෝ සේවයේ උපලේඛණගත කර ඇති තනතුරක අවුරුදු 15 ක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුව හෝ රු. 23,400 - 10x 600 - 3 x900 - 32,100 යන වැටුප් පරිමාණයේ රු. 27,600 වැටුප් ලක්ෂ්‍යයට ළඟාවීමෙන් පසුව හෝ එම නිළධාරියා රු. 31,200 - 5 x 900 - 35,700 ක වැටුප් පරිමාණයේ පිහිටුවනු ලැබේ. සේවයේ II පන්තියට 1988.01.01 දින සහ 1988.12.01 දින අන්තර්ග්‍රහණය කරනු ලැබූ නිළධාරියෙකු රු. 55,200- 7 x2,400 – 72,000 වැටුප් පරිමාණයේ පිහිටුවනු ලැබේ.

(iv) ගුරු විද්‍යාල (I ශ්‍රේණියේ) කථිකාචාර්යවරයෙකු හෝ සැළසුම් නිළධාරී හෝ ශ්‍රේණියේ විශේෂ තනතුරක් දැරූ නිළධාරියෙකු හෝ රු. 18,600 - 16 x 600 - 28,200 ක වැටුප් පරිමාණයේ පිහිටුවනු ලැබේ.

(v) III වන පන්තියට අන්තර්ග්‍රහණය කර ඇති, නියමිත දිනට සේවයේ උපලේඛණගත කොට ඇති තනතුරක අවුරුදු 8ක සේවයක් තිබුනා වූ ද ඔහුට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ වලින් සහ දෙවන භාෂා විභාගයෙන් සමත්වී ඇත්තා වූ ද රාජ්‍ය භාෂාවෙන් අවශ්‍ය ප්‍රවීණත්වය ලබා ඇත්තා වූ හෝ මෙම විභාග වලින් නිදහස් කර ඇත්තා වූ V වන පන්තියේ නිළධාරියෙකු හෝ ගුරු අභ්‍යාස විදුහල්වල (II වන පන්තියේ ) කථිකාචාර්යවරයෙකු හෝ රු 18,600 - 16 x 600- 28,200ක වැටුප් පරිමාණයේ පිහිටවනු ලැබේ.

(vi) III වැනි පන්තියට අන්තර්ග්‍රහණය කර ඇති, නියමිත දින සේවයේ V වන පන්තියේ සිටිය නිළධාරියෙකු හෝ ගුරු අභ්‍යාස විද්‍යාලවල (II වන ශ්‍රේණියේ ) කථිකාචාර්යවරයෙකු හෝ සේවයේ උපලේඛණගත කොට ඇති තනතුරක නියමිත දිනට අවුරුදු 8 කට අඩු සේවයක් තිබුනේ නම් ඔහු රු. 15,600-5 x480- 9x 600 – 23,400 ක අතුරු වැටුප් පරිමාණයක පිහිටුවනු ලැබේ. නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ වලින් හා දෙවන භාෂා විෂයයෙන් සාමාර්ථය ද අවශ්‍ය රාජ්‍ය භාෂා ප්‍රවීණත්වය ද ලබා සේවයේ උපලේඛණගත කොට ඇති තනතුරක අවුරුදු 8ක් සම්පූර්ණ කිරීමෙන් පසු එම නිළධාරියා රු 18,600 - 16 x600 – 28,200 ක වැටුප් පරිමාණයේ පිහිටුවනු ලැබේ.

සංලක්ෂ්‍යය .– සේවයට අන්තර්ග්‍රහණය කරන ලද නිළධාරියෙකු අන්තර්ග්‍රහණය කරන ලද අවස්ථාවේ 29 වන ඡේදයේ ප්‍රකාර තමන්ට නියමිත වැටුප් පරිමාණයට වඩා වාසිදායක වැටුප් පරිමාණයක් ලබමින් සිටියේ නම් තම මුල් වැටුප් පරිමාණය පෞද්ගලික වශයෙන් තබා ගැනීම පිණිස මනාපය පළ කිරීමට ඔහුට හිමිකම් ඇත.

30. මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙන් විධිවිධාන සළසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය තීරණය කරනු ඇත.

ටී. එම්. එම්. තෙන්නකෝන්,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව.

2002 මාර්තු මස 15 වැනි දින, බත්තරමුල්ල,
පැලවත්ත,
"...රුපාය"හි රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ,
අ...පන සේවා කමිටුවේ දී ය.

## තනතුරු උපලේඛණය

### I වැනි පන්තිය

| | |
|---|---|
| අධ්‍යාපන අධ්‍යක්ෂ | 19 |
| විභාග කොමසාරිස් | 01 |
| ~~අතිරේක විභාග කොමසාරිස්~~ | 03 |
| අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් | 01 |
| අතිරේක අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් | 02 |
| පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ | 08 |
| අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ | ~~16~~ |
| කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ | ~~50~~ |
| ජාතික පාසල් විදුහල්පතිවරු | ~~100~~ |
| | 200 |

### II වැනි පන්තිය

*සාමාන්‍ය සේවක සංඛ්‍යාව*

| | |
|---|---|
| ප්‍රධාන අධ්‍යාපන නිලධාරී | 59 |
| විදුහල්පති හෝ නියෝජ්‍ය විදුහල්පති | 118 |
| ගුරු විදුහල්පති | 05 |
| ගුරු උප විදුහල්පති | 01 |

*විශේෂ සේවක සංඛ්‍යාව*

| | |
|---|---|
| ප්‍රධාන අධ්‍යාපන නිලධාරී | 53 |
| නියෝජ්‍ය විභාග කොමසාරිස් | 15 |
| ප්‍රධාන සංස්කාරක, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව | 20 |
| ප්‍රධාන සැළසුම් නිලධාරී | 25 |
| ගුරු විද්‍යාල කථිකාචාර්ය (අධි ශ්‍රේණිය) | 04 |
| | 300 |

### III වැනි පන්තිය

*සාමාන්‍ය සේවක සංඛ්‍යාව*

| | |
|---|---|
| අධ්‍යාපන නිලධාරී | 243 |
| විදුහල්පති/ නියෝජ්‍ය විදුහල්පති | 653 |
| ගුරු විදුහල්පති | 22 |
| ගුරු උප විදුහල්පති | 14 |

විශේෂ සේවක සංඛ්‍යාව

| | |
|---|---|
| අධ්‍යාපන නිලධාරී | 256 |
| සංස්කාරක, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව | 90 |
| සහකාර විභාග කොමසාරිස් | 20 |
| ගුරු විදුහල් කථිකාචාර්ය | 403 |
| සැළසුම් නිලධාරී | 75 |
| අගැයීම් නිලධාරී | 07 |
| | 1783 |

## *"අ" පරිශිෂ්ඨය*

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වන පන්තියට පත් කිරීම සඳහා පවත්වන
විවෘත තරග විභාගය පිළිබඳ විස්තර, ව්‍යවස්ථා සංග්‍රහයේ 05 ජේදය

පරීක්ෂා කිරීමේ ක්‍රමය .–

කොටස් දෙකකින් සමන්විත වන විභාගයක් පවත්වනු ලැබේ.

*I වන කොටස*

ප්‍රශ්න පත්‍ර දෙකකින් යුත් විභාගයක් –

(i) අවබෝධය ප්‍රශ්න පත්‍රය - ලකුණු 100යි
(ii) බුද්ධි පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය - ලකුණු 100 යි

*I වන කොටස සියළුම අපේක්ෂයින් සඳහා අනිවාර්ය වේ.*

*විෂය නිර්දේශය* :

(i) අවබෝධය - කාලය පැය 1 1/2 යි.

විභාග අපේක්ෂකයාට කෙටි පාඨ ගණනාවක් ඉදිරිපත් කරනු ලැබේ. ඇතැම් පාඨ සම්බන්ධයෙන් අපේක්ෂකයා වෙත විකල්ප ප්‍රකාශ ගණනාවක් ඉදිරිපත් කෙරෙන අතර, ඉන් එකක් එම පාඨයේ ඇති කරුනු වලට ඉතා හොඳින් ගැලපෙනු ඇත. වඩාත්ම උචිත ප්‍රකාශය තෝරන ලෙස විභාග අපේක්ෂකයින්ට නියම කරනු ලැබේ. විභාග අපේක්ෂකයා අනික් පාඨවල අර්ථය වටහා ගන්නා අන්දම පරීක්ෂා කිරීමට හැකිවන පරිදි මේ පාඨය සම්බන්ධයෙන් ප්‍රශ්න ඉදිරිපත් කෙරේ.

(ii) බුද්ධි පරීක්ෂණය -කාලය පැය 1 යි

අපේක්ෂකයාගේ තර්කණ ශක්තිය මැනීම පිණිස සකස්කරන ලද ප්‍රශ්න පත්‍රයකි.

*II වන කොටස*

ප්‍රශ්න පත්‍ර 2 කින් සහ සම්මුඛ පරීක්ෂණයකින් යුත් විභාගයක්

(i) සාමාන්‍ය දැනීම ප්‍රශ්ණ පත්‍රය - ලකුණු 150යි
(ii) වාක්‍ය රචනය ප්‍රශ්න පත්‍රය - ලකුණු 100 යි

I වන කොටසේ ඇති එක් එක් ප්‍රශ්න පත්‍රයෙන් සෑහෙන ප්‍රමාණයක උසස් මට්ටමකින් ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් පමණක් II වන කොටසේ විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබනු ඇත.

*විෂය නිර්දේශය* :

(i) සාමාන්‍ය දැනීම ප්‍රශ්න පත්‍රය - කාලය පැය 3 යි

ශ්‍රී ලංකාවේ දේශපාලනමය, සාමාජීය, සංස්කෘතික, හා ආර්ථික පරිසරය ද ඇතුළුව අපේක්ෂකයා ජීවත් වන සහ වැඩ කරන පරිසරය ජාතික හා ජාත්‍යන්තර වශයෙන් වැදගත් වන කාලීන සිදුවීම් මෙන්ම විද්‍යාත්මක හා තාක්ෂණික වර්ධනය පිළිබඳ ඔහුගේ ඇති දැනුම පරීක්ෂා කිරීම සඳහා වූ ප්‍රශ්න පත්‍රයක්, ප්‍රශ්න තෝරා ගැනීමට ඉඩදෙනු ලැබේ.

(ii) වාක්‍ය රචනා -කාලය පැය 3 යි

නානා විෂයයන් අතුරෙන් තෝරා ගන්නා විෂයයන් තුනක් ගැන වාක්‍ය රචනා තුනක් ලිවීම අපේක්ෂා කෙරේ. මෙම විෂයයන් එක් විශේෂ අධ්‍යයන ක්ෂේත්‍රයකට සම්බන්ධ නොවන අතර, අපේක්ෂකයාගේ සාමාන්‍ය දැනුම සහ බුද්ධිය, සාමාන්‍ය කල්පනා කිරීම් හා අදහස් ප්‍රකාශ කිරීමේ ශක්තිය මැන බැලීම සඳහා සකස් කරනු ඇත. වාක්‍ය රචනාවල තත්ත්වය නිශ්චය කරනුයේ විෂය පිළිබඳව ඇති නිර්මාණ ශක්තිය හා කල්පනා ශක්ති ප්‍රමාණය මෙන්ම ඒවා ඉදිරිපත් කරන ආකාරය ද අනුවය.

(iii) සම්මුඛ පරීක්ෂණය

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ අදහස් විමසීමෙන් පසුව, කමිටුව විසින් පත් කරනු ලබන රජයේ නිළධාරීන් 5 දෙදෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක් විසින් අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන්නේ මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පමණකි.

*සැලකිය.*- විභාග අපේක්ෂකයින්ගේ කුසලතා අනුපිළිවෙල තීරණය කරනු ලබන්නේ ඔවුන් ලිඛිත විභාගයේදී ලබා ගන්නා ලකුණු මතය.

"ආ" පරිශිෂ්ඨය

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වන පන්තියට පත් කිරීමේ
සීමිත තරඟ විභාගය පිළිබඳ විස්තර, ව්‍යවස්ථා සංග්‍රහයේ 08 වැනි ඡේදය

*පරීක්ෂා කිරීමේ ක්‍රමය* :

පහත සඳහන් විෂයයන් ලිඛිත ප්‍රශ්න පත්‍රවලින් සමන්විත විභාගයකින් හා සම්මුඛ පරීක්ෂණයකින් යුක්ත වනු ඇත.

(i) බුද්ධි පරීක්ෂණය - ලකුණු 100යි

(ii) අවබෝධය - ලකුණු 100 යි

(iii) අධ්‍යාපන පරිපාලනය පිළිබඳ සිද්ධි අධ්‍යයනය - ලකුණු 100යි

*විෂය නිර්දේශය*

(i) බුද්ධි පරීක්ෂණය - කාලය පැය 1යි
අපේක්ෂකයාගේ තර්කන ශක්තිය මැනීම සඳහා සකස් කරන ලද ප්‍රශ්න පත්‍රයකි.

(ii) අවබෝධය - කාලය පැය 1 1/2 ලකුණු 100 යි

විභාග අපේක්ෂකයින්ට කෙටි පාඨ ගණනාවක් ඉදිරිපත් කරනු ලැබේ. ඇතැම් පාඨ සම්බන්ධයෙන් අපේක්ෂකයා වෙත විකල්ප ප්‍රකාශ ගණනාවක්ම ඉදිරිපත් කෙරෙන අතර, ඉන් එකක් එම පාඨයේ ඇති කරුණුවලට ඉතා හොඳින් ගැලපෙනු ඇත. වඩාත්ම උචිත ප්‍රකාශය තෝරන ලෙස විභාග අපේක්ෂකයින්ට නියම කරනු ලැබේ. විභාග අපේක්ෂකයා අන් පාඨවල අර්ථය වටහා ගන්නා අන්දම පරීක්ෂා කිරීමට හැකිවන පරිදි එම පාඨ සම්බන්ධයෙන් ප්‍රශ්න ඉදිරිපත් කෙරේ.

(iii) අධ්‍යාපන පරිපාලනය පිළිබඳ සිද්ධි අධ්‍යයනය -කාලය පැය 2 යි

(iv) සම්මුඛ පරීක්ෂණය

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ අදහස් විමසීමෙන් පසුව කමිටුව විසින් පත්කරනු ලබන රජයේ නිලධාරීන් 05 දෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක් විසින් අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන්නේ මූලික සුදුසුකම් පරීක්ෂා සඳහා කිරීම පමණි.

*සැලකිය.*- විභාග අපේක්ෂකයින්ගේ කුසලතා අනුපිළියෙල තීරණය කරනු ලබන්නේ ඔවුන් ලිඛිත විභාගයේ දී ලබාගන්නා ලකුණු මතය.

"ඇ" පරිශිෂ්ඨය

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලනය සේවයේ III වන පන්තියට පත් කරන ලද නිලධාරින් සඳහා පවත්වනු ලබන I වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට නියමිත විෂය නිර්දේශය සහ II වැනි කාර්යක්ෂමතා කඩඉම් පිළිබඳ විස්තර ව්‍යවස්ථා සංග්‍රහයේ 21 ඡේදය

(අ) I වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

1. I වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට පහත දැක්වෙන විෂයයන් ඇතුළත් වේ.

(i) සාමාන්‍ය පරිපාලනය - ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආයතන සංග්‍රහයේ විධිවිධාන සහ රජයේ වෙනත් රෙගුලාසි,
(ii) මුදල්,
(iii) අධ්‍යාපනය, අධ්‍යාපන නීතිය, පරිපාලන හා අධීක්ෂණය.

2. නිලධාරියෙකුට I වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීකෂණයට නියමිත විෂයයන් සඳහා එකම වතාවක දී හෝ වෙන වෙනම අවස්ථා කිහිපයක දී හෝ පෙනී සිටිය හැකිය.

3. සෑම ප්‍රශ්න පත්‍රයකටම කාලය පැය 3 යි

4. විෂය නිර්දේශය

(i) සාමාන්‍ය පරිපාලනය

(අ) ලංකා (ආණ්ඩුක්‍රම) රාජ ආඥාව 1946 හා 1947 (973 වැනි පරිච්ඡේදය ) 1948 අංක 18 දරන පුරවැසි පනත (349 වැනි පරිච්ඡේදය)

1972 මැයි 22 දින පනවා සම්මත කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත

1981 අංක 19 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත
1981 අංක 7 දරන ජනමත විචාරන පනත
1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ පනත
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී සමූහාණ්ඩුවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

(ආ) කාර්යාලීය සහ ක්ෂේත්‍ර සංවිධානය සහ ක්‍රම, ආයතන සංග්‍රහයේ පරිච්ඡේද I, II, III, IV, V, VI, VII, IX, X, XI, XVI, XXV, XXVI, XXVII, XXIX, XXXI, XXXII, XXXIII, XLVII, XLVIII

*ආයතන සංග්‍රහයේ පරිච්ඡේද*

(II) මුදල්
(අ) රජයේ මුදල් රෙගුලාසි I කොටස (I වැනි පරිච්ඡේදය හැර),

(ආ) ප්‍රවර්තන වර්ෂයේ ආදායම් හා වැය ඇස්තමේන්තු උදා. ඒවායේ සැකැස්ම ආදායම් ශීර්ෂ, මුදල් හා විසර්ජන පනත්,

(ඇ) අධ්‍යාපන කාර්යාල මගින් ඉටු කරනු ලබන නිශ්චිත ගිණුම් කටයුතුවලට අදාළවන ආඥාපනත් සහ වෙනත් නීති ප්‍රඥප්ති,

(iii) අධ්‍යාපනය, අධ්‍යාපන නීතිය, පරිපාලනය සහ අධීක්ෂණය,

(අ) අධ්‍යාපන නීතිය.- අපේක්ෂකයන් පහත සඳහන් ආඥාපත් සහ පාර්ලිමේන්තු පනත් පිළිබඳ දැනුම හා අවබෝධය ලබා තිබිය යුතුය.

1939 අංක 31 දරන අධ්‍යාපන ආඥාපනත,
1947 අංක 26 දරන සංශෝධන ආඥාපනත,
1951 අංක 05 දරන සංශෝධන පනත,
1953 අංක 43 දරන සංශෝධන පනත,
රජයේ පාසල් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය,
1960 අංක 05 දරන උපකෘත පාසල් සහ ගුරු විද්‍යාල (විශේෂ විධිවිධාන ) (සංශෝධන ) පනත,

1961 අංක 8 දරන උපකෘත පාසල් හා ගුරු විද්‍යාල (අතිරේක විධිවිධාන ) පනත,
1973 අංක 35 දරන අධ්‍යාපන (පදවිනාම වෙනස් කිරීමේ ) පනත,
1979 අංක 64 දරන පිරිවෙන් පනත,
1981 අංක 65 දරන උපකෘත පාසල් සහ ගුරු විද්‍යාල (විශේෂ විධිවිධාන ) (සංශෝධන) පනත 1985 අංක 28 දරණ ජාතික, අධ්‍යාපන ආයතන පනත.

(ආ) අධ්‍යාපන පරිපාලනය

(1) අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති :
 (i) අධ්‍යාපන අමාත්‍යාංශය,
 (ii) දිස්ත්‍රික් දෙපාර්තමේන්තු ද ඇතුළුව අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු සහ ආයතනවල සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ සංවිධානය සහ කාර්යයන්,
 (iii) ජාතික හා ප්‍රදේශීය මට්ටමින් අධ්‍යාපනික සැලසුම් කිරීම පරමාර්ථ ක්‍රම (පාසැල් සැකසුම් ඇතුළුව) ක්‍රියාත්මක කිරීම යනාදිය.

(2) පාසල් කළමනාකරණය, පාසල් ප්‍රජා සම්බන්ධතා
(3) අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය
(4) විශේෂ අධ්‍යාපන වැඩ සටහන්

(ඇ) අධ්‍යාපන අධීක්ෂණය
පාසල් අධීක්ෂණය සඳහා ක්‍රම හා ගුරුවරුන්ගේ කාර්ය සාධනය ඇගැයීම සඳහා උපයෝගී කර ගන්නා උපමාන
පාසල්වල අඛණ්ඩ ඇගැයීම් වැඩ සටහන්
පාසල්වල ස්වයං ඇගැයීම් වැඩ සටහන්

දිස්ත්‍රික් දෙපාර්තමේන්තු සහ අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පාසල් අධීක්ෂණය කිරීම
බාහිර කණ්ඩායම් මගින් අභ්‍යන්තර ඇගැයීම් සුපරීක්ෂණය

(අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ, අත්පොත් හා වෙනත් ප්‍රකාශන පිළිබඳ මනා අවබෝධයක් ඇති කර ගන්නා ලෙස අපේක්ෂකයින්නට උපදෙස් දෙනු ලැබේ.)

*නිර්දේශන ග්‍රන්ථ හා ප්‍රකාශන .–*

අධ්‍යාපන සැලසුම් හා පරිපාලනය පිළිබඳ ආසියාතික ආයතනය (1970)
අධ්‍යාපන පරිපාලනය පිළිබඳ නව කළමනාකරණ ශිල්පීය ක්‍රම
සම්මන්ත්‍රණයක වාර්තාවක් - නවදිල්ලිය

බැරි සහ ටයි (1975 ) පාසලක් පවත්වාගෙන යාම - ටෙම්පල් ස්මිත් ලන්ඩන්
බුෂ්. ටී. ග්ලැටර් ආර්. ගුඩ් සහ සී. රිච්ස් (1980) පාසල්
කළමනාකරණවිධි, හාර්පර් සහ රෝ
ආචාර්ය කාන් මොහිදීන් ෂෙරීප් (1983)
පාසල් පරිපාලනය - නවදිල්ලිය
අධ්‍යාපන අමාත්‍යාංශය ලංකාවේ අධ්‍යාපනය (1969)

අධ්‍යාපන හා සංස්කෘතික වැඩ කටයුතු අමාත්‍යාංශයේ ශත සංවත්සරික කාණ්ඩය II හා III වන කොටස්

විවෘත විශ්ව විද්‍යාලය (1981) පාසල්වල ප්‍රතිපත්ති සම්පාදනය සංවිධානය හා නායකත්වය (ඊ323 පාඨමාලාවේ 4 වන කොටස ) විවෘත විශ්ව විද්‍යාලය, යුනිවර්සිටි ප්‍රෙස්, ලන්ඩන්, ෂිප්මන්, මර්ටන් (1983) පාසලෙහිම ඇගයීම හයිස්මන් අධ්‍යාපන පොත් ලන්ඩන් අධ්‍යාපන අමාත්‍යාංශ අධ්‍යාපන අමාත්‍යාංශයේ කළමණාකරන ප්‍රතිසංස්කරණ පිළිබඳ වාර්තාව - 1984

(ආ) 2 වන කාර්යක්මතා කඩඉම් පරීක්ෂණය

2 වන කාර්යක්මතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කිරීම සඳහා නිළධාරියෙකු, වෘත්තීය හෝ පශ්චාත් උපාධි සුදුසුකම් ලබාගත යුතුය. මෙයට අධ්‍යාපන ඩිප්ලෝමාව හෝ ඒ හා සමාන වූ සුදුසුකමක් හෝ අධ්‍යාපන පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව හෝ පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව හෝ අධ්‍යාපන පිළිබඳ ශාස්ත්‍රපති හෝ ආචාර්ය උපාධිය හෝ වේ. අධ්‍යාපනය පිළිබඳ උපාධියක් දරන (අධ්‍යාපනවේදී)අය වෘත්තිය හෝ පශ්චාත් උපාධි සුදුසුකම් ලැබීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

03-454

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.